# බුදුබණ අසා සරණ ඉල්ලූ උපාසකවරු

## (ත්‍රිපිටක සූත්‍ර ඇසුරින් කෙරෙන විමර්ශනයක්)

ආධුනික කථිකාචාර්ය වැලිවිට සොරත හිමි

ක්‍රි. පූ. හයවෙනි සියවස වනවිට විවිධ ආගමික ඉගැන්වීම් පදනම් කරගෙන ජීවිත විමුක්තිය සොයා ගිය ගවේෂකයෝ බොහෝ පිරිසක් වූහ. ඔවුහු එතෙක් පැවති පෞරාණික ආගමික දර්ශනයන්ගෙන් වෙන්ව විමුක්තිගාමී පිරිසක් වශයෙන් කටයුතු කරන්නට වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් විවිධ ශ්‍රමණ සම්ප්‍රදායයෝ බිහිවූහ. එම ශ්‍රමණ සම්ප්‍රදායයන් අතරින් වඩාත් ප්‍රචලිතවූත්, ශ්‍රේෂ්ඨවූත්, නිරවද්‍යවූත් සංස්ථාව වූයේ ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ විසින් ඇති කරන ලද ශ්‍රාවක පිරිසයි. උන්වහන්සේ මෙම සංස්ථාව ගොඩ නැගීමේ දී කිසිවෙකුටවත් හානියක් නොවන ආකාරයට කටයුතු කරන්නට වගබලා ගත්හ. තමන්ගෙන් බණ ඇසූ සියලු දෙනා තමන් වහන්සේගේ ශ්‍රාවකයින් වියයුතු යැයි කිසිවිටෙකත් නොකීහ. නොදන්නා යමක් පිළිබඳ ව විමසා පැමිණි සියලු දෙනාටම උන්වහන්සේ ඊට ගැලපෙන විසඳුම ලබා දී ධර්මය දේශනා කළහ. එම ධර්මය අසා බොහෝ දෙනෙක් උන්වහන්සේ ළඟ පැවිද්ද ලබා ගත්හ. සත්‍ය ගවේෂණයේ නියැලී සිටි එම පිරිස් වහා ධර්මය අවබෝධ කරගෙන රහත් තත්ත්වයට පත් වී දුකින් එතෙරව ලබන විමුක්තිය හෙවත් නිවන ලබා ගත්හ. බුද්ධත්වයෙන් වසරක් ගතවන මොහොතේ කිඹුල්වත් නුවරට වඩින අවස්ථාවේ භික්ෂූන්ගේ ප්‍රමාණය 21000 ක් පමණ වූහ. මේ සියලු දෙනා සංවිධානය කිරීමක් හෝ සංස්ථාගත කිරීමකින් තොරව බුදුරජාණන් වහන්සේ වටා ඒකරාශීව සත්‍ය ගවේෂණයේ නියැලී සිටියහ. පැවිද්ද ලබා නොගත් ඇතමෙක් තෙරුවන් සරණ ගිය පිරිස් බවට පත්වූහ. ඇතමෙක් ධර්මය නොපිළිගෙන කටයුතු කරන්නට වූහ. බුදුරජුන් සමීපයෙන් බණ අසා ශ්‍රාවකයින් වූ පිරිස හැඳින්වූයේ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන නම් වලිනි. මොවුහු බුදුරජුන්ගේ සිව්වණක් පිරිස වූහ. මෙම පිරිස් අතරින් ධර්මය අසා සරණ ගිය උපාසකවරු පිළිබඳ තොරතුරු විමර්ශනය කිරීම මෙම ලිපියේ අරමුණයි.

පඨමාභිසම්බෝධියෙන් අනතුරුව බුදුරජාණන් වහන්සේ සත් සතියක් වැඩ සිටි බව පිළිගැනීම සාම්ප්‍රදායික මතයකි. ඉන් සත්වෙනි සතිය වැඩ සිටියේ රාජයතන නුග රුක මුලය. එහි වැඩ සිටි අවස්ථාවේ පුරාණ ලේ නෑයෙකු වූ දේවතාවෙක් තපස්සු භල්ලුක දෙදෙනාට බුදුරජුන් සමීපයට ගොස් දනක් දී පින් සිදු කර ගන්නා ලෙස දැනුම් දෙති. ඒ අනුව තපස්සු භල්ලුක දෙදෙනා බුදුරජුන් සමීපයට ගොස් මී පිඬු හා විළඳ පූජා කොට බුදුරජුන්ට පවසන්නේ

''එතෙ මයං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාම ධම්මඤ්ච, උපාසකෙ නො භගවා ධාරෙතු අජ්ජතග්ගේ පාණුපෙතං සරණං ගතෙ''ති.[1]

යනුවෙනි. මෙයින් කියවෙන්නේ අපි භාග්‍යවතුන් වහන්සේ හා ධර්මය සරණ යමු. අද පටන් දිවි ඇති තාක් සරණ ගිය උපාසකයන් හැටියට පිළිගන්නා ලෙසය. මේ වනවිට බුදුන් හා ධර්මය පමණක්

පැවති නිසා සම්බුද්ධ ශාසනය තුළ ද්වේවාචික උපාසක තත්ත්වයට පත් වූ ප්‍රථමයෝ වන්නේ තපස්සු හා භල්ලුක යන වෙළඳ සහෝදරයන් දෙදෙනාය.[2] මොවුන් දෙදෙනාගෙන් පසු උපාසක තත්ත්වයට පත් වූයේ යස කුල පුත්‍රයාගේ සිටු පියාණන්ය. යස කුල පුත්‍රයා නිවසේ නොසිටි බව දැනගත් පියා ඔහු සොයමින් ගියවිට බුදුරජුන් සමීපයේ පැවිදි වූ බව අසා බුදුරජුන්ගෙන් ඒ පිළිබඳ විමසීය. එවිට බුදුරජාණන් වහන්සේ පැවිදි වූ යස රහතන් වහන්සේ දක්වා සිටාණන්ට දානකථා, සීලකථා ආදී වශයෙන් මෙන්ම දුක, දුක හටගැනීම, දුක නැති කිරීම හා දුක නැති කිරීමේ මාර්ගය වශයෙන් දක්වන ලද චතුරාර්ය සත්‍ය දේශනාවෙන් ධර්මය වටහා දුන්හ. ධර්මය ඇසූ සිටුතුමා දිවි ඇති තෙක් සම්බුද්ධ ශාසනයේ බුද්ධ, ධම්ම හා සංඝ යන තෙරුවන් සරණ ලබා දෙන ලෙස ඉල්ලීය. ඒ අනුව ඔහු බුද්ධ ශාසනය තුළ තෙරුවන් සරණ ගිය ප්‍රථම උපාසකයා බවට පත්විය.[3]

මොහුගෙන් පසුව බුදුරජුන් සමීපයේ ධර්මය ඇසූවන්ගේ ප්‍රමාණය අතිවිශාලය. එසේ ධර්මය අසා උපාසක තත්වයට පත් වූ පිරිස් බොහෝය. මෙම පිරිස අනුපිළිවෙලින් දැක්වීම උගහටය. වරින් වර බුදුන් සමීපයට පැමිණ ධර්මය අසා පැහැදි උපාසක තත්ත්වය ඉල්ලූ ආකාරය දෙස බැලීමේ දී පෙනී යන්නේ සෑම දෙනා ම එක ම ආකාරයකින් එය ඉල්ලා ඇති බවය. සෑම ධර්ම දේශනාවක් අවසානයේ ම උපාසක තත්ත්වය ඉල්ලන්නට ප්‍රථම ඔවුන්ගේ මුවින් පිට වූ වාක්‍යය වන්නේ.

''ස්වාමිණි, ගෞතමයන් වහන්ස මන වඩන සුළුය. ස්වාමිණි ගෞතමයන් වහන්ස මන වඩන සුළුය. යම්සේ ස්වාමිණි යටිකුරු කළ දෙයක් උඩුකුරු කොට දැක්වූවා සේ, සඟවා තිබූ දෙයක් විවර කර පෙන්වූවා සේ, මං මුලා වූවෙකුට මාර්ගය කියා දුන්නා සේ, ඇස් ඇත්තෝ රූප දකිත්වායි සිතා අන්ධකාරේ සිටියවුන්ට පහණක් දැල්වූවා සේ, මේ ආකාරයෙන් ඔබ වහන්සේ නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කළහ. ස්වාමිණි මේ මම භාග්‍යවතුන් වහන්සේ, ධර්මය හා භික්ෂු සංඝයා සරණ යමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවි ඇති තෙක් මා සරණ ගිය උපාසකයෙකු වශයෙන් දරන සේක්වා.'' යනුවෙන් ප්‍රකාශ කර ඇත.[4]

මේ ආකාරයෙන් උපාසක තත්ත්වය ඉල්ලූ පිරිස් අතර රජවරුන්, රාජවංශිකයින්, සිටුවරු, සෙන්පතියන්, බමුණන්, පරිබ්‍රාජකයින්, මාණවකයින්, ගෘහපතියන්, වෛද්‍යවරුන්, ගම් ප්‍රධානීන්, රියදුරන්, පිරිස් වශයෙන් පැමිණි අය ආදි කොට්ඨාශ අයත් වෙති.

- උපාසක තත්ත්වය ඉල්ලූ රජවරු
- බිම්බිසාර මහ රජතුමා

බිම්බිසාර මහරජතුමා සිදුහත් තවුසා බුදුවන සමයේ මගධ රාජ්‍යයේ සිටි රාජ්‍ය පාලකයාය. බුදු වී තමන් බැහැ දැකීමට පැමිණෙන ලෙස ආරාධනා කළේද, රජගහ නුවර වේළුවනාරාමය සාදවා පළමු ආරාම පූජාව සිදු කළේ ද, අජාසත් රජුගේ පිය මහ රජාණන් වූයේ ද මේ රජුය. දානකථා සීලකථා ආදී ධර්මය අසා උපාසකයෙකු වශයෙන් පිළිගන්නා ලෙස අයැද සිටියේය.[5]

- කොසොල් රජතුමා

කෝසල ජනපදයේ දී කොසොල් රජතුමාට දේශනා කළ සූත්‍ර සංයුක්ත නිකායේ කෝසල සංයුක්තයේ එයි. එහිදී බුදුරජුන්ගේ තරුණ අවස්ථාවේදී ම දේශනා කළ සූත්‍රයක් ලෙස දහර සූත්‍රය පෙන්වා දිය හැකිය. කොසොල් රජු උපාසකයෙක් බවට පත් වූයේ එම සූත්‍රය අසීමෙන්ය.[6]

- අජාතසත්තු රජතුමා

රජගහ නුවර ජීවක අඹ වනයෙහි භික්ෂූන් වහන්සේලා සමග වැඩ සිටින අවස්ථාවේ මගධාධිපති අජාතසත්තු රජතුමාට දේශනා කළ සාමඤ්ඤ ඵල සූත්‍රය අවසානයේ උපාසකයෙකු වශයෙන් පිළිගන්නා ලෙස ඉල්ලා ඇත.[7]

- උදේන රජතුමා

ආයුෂ්මත් පිණ්ඩෝලභාරද්වාජ තෙරුන් කොසැඹෑ නුවර ඝෝෂිතාරාමයේ වැඩවසන සමයේ භාරද්වාජ සූත්‍රය දේශනා කර ඇත. මෙය දේශනා කළේ උදේන රජතුමාටය. ඔහු කොසඹෑ නුවර රාජ්‍ය ගෙන ගිය අයෙකි.[8]

- භද්දිය නම් ලිච්ඡවි රජතුමා

විශාලා මහනුවර රාජ්‍ය ගෙන ගිය ලිච්ඡවි රජවරු ප්‍රමාණයෙන් 7707 කි. ඉන් එක් අයෙක් ලෙස භද්දිය රජු හැඳින්විය හැකිය. ඔහු විශාලා මහනුවර කූටාගාර ශාලාවේදී බුදුරජුන්ගෙන් බණ අසා උපාසකයෙකු බවට පත්විය.[9]

- මුණ්ඩ රජතුමා

ආයුෂ්මත් නාරද තෙරුන් විසින් මුණ්ඩ රජතුමාට ධර්ම දේශනා කරන ලදි. මොහු පැලලුප් නුවර රාජ්‍ය ගෙන ගිය රජතුමාය.[10]

- මාධුර රජතුමා

ආයුෂ්මත් මහාකච්චාන තෙරුන් අවන්ති ජනපදයේ මධුරා නම් වනයෙහි වාසය කරන අවස්ථාවේ මාධුර රජතුමාට දේශනා කළ සූත්‍රය එනමින් හැඳින්වේ. මාධුර රජු සොළොස් මහා ජනපදයන්ගෙන් එකක් වූ අවන්ති ජනපදයේ පාලකයා විය. බ්‍රාහ්මණ සංකල්ප පිළිබඳ ව කරුණු විමසූ අවස්ථාවේ බ්‍රාහ්මණයින් පිළිබඳ බුදුරජුන් පවසා ඇති ආකාරය දේශනා කිරීමෙන් පසු උපාසකයෙකු බවට පත්විය.[11]

- අභයරාජ කුමාරයා

රජගහ නුවර වේළුවනාරාමයේ වැඩසිටින අවස්ථාවේ අභයරාජ කුමාරයාට දේශනා කළ සූත්‍රය මෙනමින් හැඳින්වේ. ඔහු නිගණ්ඨනාථපුත්තගේ මෙහෙයවීම මත බුදුරජුන් සමග වාදයට පැමිණි තැනැත්තෙකි. වාදයෙන් පරාජය වූ ඔහු උපාසකයෙක් බවට පත්විය.[12]

- බෝධිරාජ කුමාරයා

හගු නුවර සුසුමාර පර්වතයේ භේසකළා වනයෙහි වැඩ සිටින අවස්ථාවේ බෝධිරාජ කුමාරයාට දේශනා කළ සූත්‍රය එනමින් හැඳින්වේ. මොහුට කෝකනද නම් ප්‍රාසාදයක් විය. සිද්ධාර්ථ කුමාරයාට මෙන් සියලු සැප සම්පත්වලින් ආඪ්‍යව සිටි කුමාරයෙකි. මොහු මව්කුස තුළ සිටින අවස්ථාවේ තම මෑණියන් බුදුරජුන් වෙත පැමිණ තමන්ගේ කුස තුළ සිටින්නේ කුමාරයෙක් හෝ වේවා කුමාරියක් හෝ වේවා ඔහු හෝ ඇය සරණ ගිය උපාසකයෙකු ලෙස සලකන මෙන්ද, ඉපදීමෙන් පසු ඇකයෙහි වඩාගෙනවිත් මොහු උපාසකයෙකු ලෙස සලකන මෙන් ද, ඉල්ලා සිටියාය. දැන් ඔහු තෙවෙනි වරටත් බුදුරජුන්ගේ උපාසකයෙකු බවට පත්වන්නට සුදුසු යැයි ඉල්ලා සිටී.[13]

- අනේපිඬු සිටුතුමා

උපාසක තත්ත්ව ඉල්ලා ඇති එක ම සිටුවරයා මොහුය. සැවැත් නුවර පිහිටි වැඩිම ධනයක් වියදම් කොට කරන ලද විශාලතම ආරාමය වූ ජේතවනාරාමය පූජා කළේ මොහුය. බුදුරජුන්ගේ  අග්‍ර දායක වශයෙන් තනතුරු ලත් තැනැත්තාය. ජේතවන විහාරය කරවා දන් පිළිගන්නවා අවසානයේ දානකථා, සීලකථා ආදින්ගේ ආනිශංස අසා උපාසක තත්ත්වය ඉල්ලා ඇත.[14]

- උපාසක තත්ත්වය ඉල්ලූ සෙන්පතියන්
- සීහ සෙන්පතියා

විශාලා මහනුවර කුටාගාර ශාලාවේ වැඩ වසන සමයේ ලිච්ඡවි රජවරන්ගේ සෙන්පතියෙක් වූ සීහ සෙන්පතියා බුදුරජුන් වෙත් එළඹ ධර්මය ඇසීය. ඔහු නිගණ්ඨනාථ පුත්තයන්ගේ අග්‍ර ශ්‍රාවකයෙකි. බණ අසීමෙන් පසු තෙවරක් බුදුරජුන්ගෙන් උපාසක තත්ත්වය ඉල්ලා ඇත. ඒ අවස්ථාවේ බුදුරජුන් නිගණ්ඨනාථපුත්තයන්ට ද ශ්‍රාවකයෙක් වශයෙන් සිටිමින් කටයුතු කරන්න යැයි කියා උපාසකුයෙකු වශයෙන් පිළිගෙණ ඇත.[15]

- උපාසක තත්ත්වය ඉල්ලූ රාජවංශිකයින්
- පායාසි රාජවංශික තෙමේ

ආයුෂ්මත් කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ කොසොල් රට සේතබ්‍ය නම් වනයෙහි වැඩ වසන සමයේ පායාසි නම් රාජ වංශිකට දේශනා කරන ලද සූත්‍රය පායාසි රාජඤ්ඤ සූත්‍රයයි. මොහු පසේනදී කොසොල් මහරජතුමාගේ නින්දගම් ලබාගෙන ධන ධාන්‍යයෙන් ආඪ්‍යව සිටි කෙනෙකි. ධර්ම දේශනාවසානයේ කුමාර කාශ්‍යප හිමියන්ගෙන් උපාසක තත්ත්වය ඉල්ලා ඇත.[16]

- උපාසක තත්ත්වය ඉල්ලූ බමුණන්
- පොක්ඛරසාති බමුණා

කොසොල් රට ඉච්ඡානංගල නම් කොසොල් වැසි බ්‍රාහ්මණයන්ගේ ගමේ වැඩ සිටින අවස්ථාවේ අම්බට්ඨ මානවකයාට දේශනා කරන ලද අම්බට්ඨ සූත්‍රය අවසානයේ පොක්ඛරසාති බමුණා බුදුරජුන් කෙරෙහි පැහැදී තමන් මෙන්ම තමන්ගේ භාර්යාව, දූ පුතුන්, සපිරිවර සේනාව ආදි සියල්ලෝම තෙරුවන් සරණ යන බවත්, තමන් උපාසකයෙකු වශයෙන් සලකන ලෙසත් දන්වා සිටී.[17]

- සෝණදණ්ඩ බමුණා

බුදුරාජණන් වහන්සේ අංග ජනපදයෙහි සැරිසරා චම්පා නුවරට වැඩ ගග්ගර පොකුණ අසල වැඩසිටිමින් සෝණදණ්ඩ බමුණා අරභයා දේශනා කරන ලද සූත්‍රය සෝණදණ්ඩ සූත්‍රයයි. සෝණදණ්ඩ බමුණා බ්‍රාහ්මණයින් පිරිසක් පිරිවරාගෙන සිටි කෙනෙකි. ධර්මය අවසානයෙහි ඔහු ද බුදුරජුන්ගෙන් උපාසකයෙකු වන්නට අවසර පැතීය.[18]

- කූටදන්ත බමුණා

බුදුරාජණන් වහන්සේ මගධ රට ඛාණුමත නම් බමුණු ගමට වඩී කල්හි අඹයැටි උයනේ වැඩ වෙසෙන සමයේ කූටදන්ත බමුණා අරභයා දේශනා කරන ලද සූත්‍රය කූටදන්ත සූත්‍රයයි. මොහු ද බොහෝ මිනිසුන්ගෙන් ජනාකීර්ණව, මහත් ධන ධාන්‍යයෙන් ආඪ්‍යව, බිම්බිසාර රජුගෙන් නින්දගම් වශයෙන් තෑගි භෝග ලබා සිටි බමුණෙකි. සූත්‍ර දේශනාවසානයෙහි කූටදන්ත බමුණා ද බුදුසස්නෙහි උපාසකයෙකු වශයෙන් සලකන ලෙස ඉල්ලීය.[19]

- ලෝහිච්ච බමුණා

බුදුරාජණන් වහන්සේ කොසොල් රට සැරිසරමින් සාලවතිකා උයනේ වැඩ සිටින අවස්ථාවේ ලෝහිච්ච බ්‍රාහ්මණයාට දේශනා කළ සූත්‍රය ලෝහිච්ච සූත්‍රයයි. මොහු කොසොල් මහරජතුමාගෙන් නින්දගම් ලබාගෙන ධන ධන්‍යයෙන් ආඪ්‍යව සිටි පිරිස් සහිත බ්‍රාහ්මණයෙකි. ධර්ම අසා උපාසක තත්ත්වය ඉල්ලා ඇත.[20] මොහුම පසුකලෙක ආයුෂ්මත් කච්චාන හිමියන්ගෙන් ද බණ අසා උපාසක තත්ත්වය ඉල්ලා ඇත.[21]

- ජාණුස්සෝණි බමුණා

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩසිටින සමයේ ජාණුස්සෝණි බමුණාට දේශනා කළ සූත්‍රය භයභේරව සූත්‍රයයි. මොහු බුදුන්ගෙන් නොයෙක් ධර්මයන් ඇසූවෙකි. බුද්ධ දේශනාවල බමුණන්ට දේශනා කළ සූත්‍ර අතරින් වැඩි ප්‍රමාණයක් දේශනා කර ඇත්තේ මොහුටය. චූළහත්ථිපදොපම සූත්‍රය, මොහුද බුදුන්ගෙන් බණ අසා උපාසක තත්ත්වය ඉල්ලා සිටියේය.[22]

- කසීභාරද්වාජ බමුණා

සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වෙසෙන සමයේ පිඬු පිණිස යන අතරේ හමු වූ කසීභාරද්වාජ බමුණාට දේශනා කළ සූත්‍රය එනමින් හැඳින්වේ. බුදුන් සමග කෘෂිකර්මාන්තය

සම්බන්ධයෙන් නොයෙක් ආකාරයෙන් කරුණු ඉදිරපත් කොට අවසානයේ සත්‍ය තේරුම් ගැනීමෙන් පසු උපාසකයෙකු බවට පත්විය.[23]

- අග්ගිකභාරද්වාජ බමුණා

සැවැත් නුවර දී බුදුරජුන්ට මුඩු මහණ, වසලය යැයි කී අග්ගිකභාරද්වාජට වසල ධර්මයන් පිළිබඳ අවබෝධයය දුන් පසු උපාසකයෙකු බවට පත්විය.[24]

- බ්‍රහ්මායු බමුණා

වේදේහ නුවර චාරිකවේ යෙදනෙ විට මිථිලාවෙහි වාසය කළ බ්‍රහ්මායු බමුණාට දේහිත සූත්‍රය බ්‍රහ්මායු සූත්‍රයයි. මොහු තිවේදයෙහි පාරප්‍රාප්ත, ඉතිහාස නිඝණ්ඩු, කෙටුභ, ව්‍යාකරණ ආදි ශාස්ත්‍රයන් පිළිබඳ දැනුමක් ලබා සිටි කෙනෙකි. පටිච්චසමුප්පාද දේශනාව අසා උපාසකයෙකු විය.[25]

- උදය බමුණා

සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වෙසෙන සමයේ උදය බමුණා අරභයා දේශිත සූත්‍රය උදය සූත්‍රයයි. බුදුරජුන් උදය බමුණාගේ නිවසට නිතර නිතර පිඬු පිණිස වඩින විට නැවත නැවතත් තම නිවසට එන බව සිතූ ඔහුට ඒ බව නො අඟවා බුදුරජුන් ධර්මය දේශනා කළ සේක. ඒ අසා ඔහු උපාසකයෙකු බවට පත්විය.[26]

- පිංගලකොච්ච බමුණා

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ සිටින අවස්ථාවේ පිංගලකොච්ඡ නම් බමුණාට දේශනා කරන ලද සූත්‍රය චූළසාරොපම සූත්‍රයයි. ඔහු එකල ෂට් ශාස්තෘවරුන් වශයෙන් සිටි ශ්‍රමණයින් පිළිබඳ කරුණු විමසූ අවස්ථාවේ මේ දේශනාව සිදු කර ඇත. දේශනාවසානයෙහි ඔහු ද උපාසක තත්ත්වය ඉල්ලා සිටියේය.[27]

- දෙවහිත බමුණා

සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසන සමයේ දේවහිත බමුණාට එනමින් යුත් සූත්‍රය දේශනා කර ඇත. බුදුරජාණන් වහන්සේ වාතාබාධයකින් පෙළුණ අවස්ථාවේ උපස්ථායක උපවාණ තෙරුන් දෙවහිත බමුණාගෙන් උණු පැන් ගෙන බුදුරජුන්ට උපස්ථාන කළේය. එවිට දේවහිත බමුණා බුදුන් වෙත පැමිණ දීමේ ආනිශංස අසා පැහැදි උපාසකයෙකු විය.[28]

- ඝෝටමුඛ බමුණා

ආයුෂ්මත් උදේන රහතන් වහන්සේ බරණැස් නුවර ඛේමිය නම් අඹ වනයෙහි වාසය කරන කල්හි ඝොටමුඛ නම් බමුණාට දේශනා කළ සූත්‍රය මෙයයි. මොහු බ්‍රාහ්මණ ධර්මය ඉහළින් පිළිගෙන කටයුතු කළ අතර, අත්තන්තප පරන්තප ආදි වහයෙන් දැක්වෙන පුද්ගල වර්ගීකරණයක් පිළිබඳ

අවබෝධය ලබා ගැනීමෙන් පසු උපාසකයෙකු විය.[29] බුදුරජුන් වැඩ සිටියත් පරිනිර්වාණය කළත් තමා උන්වහන්සේගේ ම ශ්‍රාවකයෙකු වශයෙන් පිළිගන්නා ලෙස ආයුෂ්මත් උදෙන තෙරුන්ගෙන් ඉල්ලා සිටියේය.

- චංකී බමුණා

කොසොල් ජනපදයේ ඕපාසාද නම් කොසොල් වැසි බමුණු ගමෙහිදී චංකී බමුණාට දේශනා කළ සූත්‍රය මෙනමින් හැඳින්වේ. මොහු කොසොල් මහරජතුමාගෙන් නින්දගම් වශයෙන් ඕපාසාද ගම්වරය ලබාගෙන බොහෝ බමුණු පිරිසක් සමග වාසය කළ තැනැත්තෙකි. බුදුරජුන්ගේ කීර්ති ශබ්දය අසා පැමිණ බණ අසා උපාසකයෙකු වූවෙකි.[30]

- මානත්ථද්ධ බමුණා

සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වෙසෙන සමයේ මානත්ථද්ධ නම් බමුණාට එනමින් සූත්‍රය දේශනා කර ඇත. මොහු මවට පියාට ගුරුවරන්ට වැඩිමහල්ලන්ට අභිචාර නොදක්වා මානයෙන් යුක්තව සිටි කෙනෙකි. ඇතැම් විට මොහුගේ නම මෙය නොවුණත් ''මානයෙන් උඩඟු වූ''[31] යන අර්ථ ඇති මානත්ථද්ධ යන නමින් හඳුන්වන්නට ඇත. ඔහු තුළ තිබූ මානය චුරු කිරීමෙන් පසු තෙරුවන් සරණ ගිය උපාසකයෙක් විය[32]

- ඒසුකාරි බමුණා

සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වෙසෙන සමයේ එසුකාරි බමුණා අරභයා දේශනා කළ සූත්‍රය එසුකාරි සූත්‍රයයි. මොහු චතුර් වර්ණය සම්බන්ධයෙන් පැණ විසඳුම් ලබාගෙන උපසකයෙකු වූවෙකි[33]

- ගණකමොග්ගල්ලන බමුණා

සැවැත් නුවර විශාඛා මහ උපාසකාව විසින් කරන ලද පූර්වාරාමයේ වැඩ වෙසෙන සසමයේ ගණක මොග්ගල්ලාන උදෙසා එනමින් සූත්‍රය දේශනා කර ඇත. බුදුසසුනෙහි කියවෙන අනුපුව ශික්ෂාව, අනුපූර්ව ක්‍රියාව හා අනුපූර්ව ප්‍රතිපදාව ආදි වශයෙන් ධර්මය අවබෝධ කරගත් මොහු බුදු සසුනේ උපාසකයෙක් බවට පත්විය.[34]

- පඤ්චනීකසාත බමුණා

සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ වෙසෙන සමයේ පඤ්චනීකසාත නම් බමුණාට එනමින් සූත්‍රයක් දේශනා කර ඇත. සිතේ අප්‍රසාදය, වෛරය දුරු කිරීමෙන් යහපත් වචන කථා කළ හැකි බව පෙන්වා දී තිබේ. එයින් ම ඔහුට ධර්මාවබෝධය ඇති වී තෙරුවන් සරණ ගිය උපාසකයෙකු බවට පත් වී ඇත.[35]

- නවකම්මික භාරද්වාජ බමුණා

කොසොල් රට එක්තරා වණ ලැහැබක වැඩ සිටින විට නවකම්මික සූත්‍රය දේශනා දේශනා කර ඇත. නවකම්මික භාරද්වාජ තෙමේ වනයේ ගස් කපමින් ජීවිකා වෘත්තිය ගෙන ගිය අයෙකි. වනයට, පරිසරයට ආදරය කළ බුදුන් වහන්සේ එහි ඇති අගය පෙන්වා දෙමින් ධර්මය දේශනා කළ විට උපාසකයෙකු විය.[36]

- මාතුපෝසක බමුණා

සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වෙසෙන සමයේ මාතුපොසක බමුණාට මාතුපොසක සූත්‍රය දේශනා කර ඇත. මවට සැලකීමේ වන ආනිශංස අසා ඔහු උපාසකයෙකු විය.[37]

- භික්ඛක බමුණා

සැවැත් නුවර වැඩවසන සමයේ භික්ඛක බමුණාට භික්ඛක සූත්‍රය දේශනා කර ඇත. බුදුන් වහන්සේ මෙන් ම තමන් ද භික්‍ෂාවෙන් වාසය කරන බවත් පැවසූ අතර දෙදෙනා අතර වෙනසක් ඇති වීමට හේතු විමසූ අවසාථාවේ ඊට පිළිතුරු ලෙස පින් සහ පව් දෙක ම දුරුකොට බ්‍රහ්මචරියාවෙහි හැසිරීම නියම භික්‍ෂුවගේ ක්‍රියා කලාපය බව දැනගත් පසු උපාසකායකු විය.[38]

- සංගාරව බමුණා

සැවැත් නුවර වැඩවසන සමයේ සංගාරව බමුණාට සංගාරව සූත්‍රය දේශනා කර ඇත. උදේ කළ පව් වලට සවස ජලයට ගොස් සිට හා රාත්‍රියේ කළ පව්වලට උදේ ජලයට ගොස් බොහෝ වේලාවක් හිඳීම නිසා ජලයෙන් පිරිසිදු බව ලැබෙන බව කියමින් උදේ සවස වතුරට බැස සිටීම නිසා ඔහුට අනුකම්පාවෙන් ඔහුගේ නිවසට ගොස් ධර්මය දේශනා කර ඇත. එබඳු පිරිසිදුකමක් ලැබෙන්නේ නම් ජලයේ මාළුවන් සියලු දෙනා ස්වර්ගයේ සිටිය යුතු බව මෙහිදී පෙන්වා දී තිබේ.[39]

- උපාසක තත්ත්වය ඉල්ලූ පරිබ්‍රාජකයින්
- පොට්ඨපාද පරිබ්‍රාජකයා

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු සිටුතුමා විසින් කරවන ලද ජේතවනාරාමයේ වැඩ වාසය කරන කල්හි ඒකසාලක හෙවත් තින්දුකාචීර නම් මල්ලිකා දේවියගේ උයනේ පිරිවර තුන්දහසක් දෙනා සමග සිටි පොට්ඨපාද පරිබ්‍රාජකයා අරභයා දේශනා කරන ලද සූත්‍රය පොට්ඨපාද සූත්‍රයයි. ධර්ම කරුණු විස්තර දැනගැනීමෙන් පසු පොට්ඨපාද පරිබ්‍රාජකයා තෙරුවන් සරණ ගිය උපාසකයෙක් බවට පත්විය.[40]

- වච්ඡගොත්ත පරිබ්‍රාජකයා

සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩවසන සමයේ වච්ඡගොත්ත පරිබ්‍රාජකයාට දේශනා කළ සූත්‍රය අග්ගිවච්ඡගොත්ත සූත්‍රයයි. දස අව්‍යාකෘත ප්‍රශ්න විචාළ මොහුට බුදුරජුන් එම ප්‍රශ්න පසෙකින් තබා ධර්මය දේශනා කළ සේක. කරුණු අවබෝධ කරගත් ඕහු උපාසකයෙකු බවට පත්විය.[41]

- දීඝනඛ පරිබ්‍රාජකයා

රජගහනුවර ගිජ්ඣකූට පර්වතයේ වැඩ වෙසෙන සමයේ එහි පැමිණි දීඝනඛ පරිබ්‍රාජකයාට දෙසූ සූත්‍රය දීඝනඛ සූත්‍රයයි. දිට්ඨිවාදයෙන් බුදුන් සමග වාදයකට පැමිණ ඉන් පරාජය වී තෙරුවන් සරණ ගොස් උපාසකයෙකු වූවෙකි.[42]

- වේඛනස පරිබ්‍රාජකයා

සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වෙසෙන සමයේ වේඛනස පරිබ්‍රාජකයාට දේශනා කළ සූත්‍රය එනමින් හැඳින්වේ. බුදුන් සමීපයට පැමිණ කරන ලද උදානයක් හේතුකොටගෙන ධර්මය දේශනා කර ඇත. එය අසා ඕහු ද උපාසකයෙකු බවට පත්විය.[43]

- අස්සලායන පරිබ්‍රාජකයා

සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වාසය කරන සමයේ අස්සලායන පරිබ්‍රාජකයාට දේශනා කළ සූත්‍රය මෙනමින් හැඳින්වේ. මොහු සොළොස් විය වනවිට ත්‍රිවේදයෙහි පරතෙරට පත්ව, ඉතිහාසය, නිඝණ්ඩු, කෙටුභ, ව්‍යාකරණ ආදි ශාස්ත්‍රයන් පිළිබඳ ව මනා දැනුමක් ලබා සිටි කෙනෙකි. බොහෝ බ්‍රාහ්මණයෝ මොහු කරා පැමිණ බුදුන් සමග වාද කරන්නට යමු යැයි ඉල්ලා සිටි හෙයින් ඕහු බුදුන් සමීපයට ගොස් විවිධාකාර වාද කළේය. බුදුරජුන් චතුර් වර්ණය හා ඒ හා සම්බන්ධ සියලු තොරතුරු අවබෝධ කර දීමෙන් පසු උපාසකයෙකු බවට පත්විය.[44]

- උපාසක තත්ත්වය ඉල්ලූ මාණවකයින්
- වාසෙට්ඨ හා භාරද්වාජ මානවක දෙදෙනා

බුදුරජාණන් වහන්සේ කොසොල් රට වැඩ වසන සමයේ මනසාකට නම් කොසොල් වැසි බමුණන්ගේ ගමේදී වාසෙට්ඨ හා භාරද්වාජ දෙදෙනාට දේශනා කළ සූත්‍රය තෙවිජ්ජ සූත්‍රයයි. මොවුන් දෙදෙනා පොක්ඛරසාති බමුණාගේ අන්තේවාසික දෙදෙනෙකි. සූත්‍ර දේශනාවසානයෙහි දෙදෙනාම උපාසක තත්ත්වය ඉල්ලා ඇත.[45] මොවුන් දෙදෙනාටම දේශනා කළ සූත්‍රයක් වන්නේ වාසෙට්ඨ සූත්‍රයයි. එම සූත්‍රාවසානයේ දී ද දෙදෙනාම උපාසක තත්ත්වය ඉල්ලා ඇත.[46]

- පුක්කුස මල්ලව පුත්ත මාණවක

මහාපරිනිබ්බාණ සූත්‍රය බුදුරජුන්ගේ ජීවන සමයේ අවසාන භාගයේ දේශනා කරන ලද සූත්‍රයකි. එම සූත්‍රය උන්වහන්සේ විසින් චාරිකා කරන අවස්ථාවන්හිදි දේශනා කරන ලද්දකි. කුසිනාරා නුවරදි හමුවූ පුක්කුස මල්ලව පුත්තට ධර්ම දේශනා කර ඇත. මොහු ආළාර කාළාමයන්ගේ ශ්‍රාවකයෙකි. තෙරුවන් සරණ ගිය මාණවකයෙකි.[47]

- පුණ්ණ කොලිය පුත් මාණවක

භාග්‍යවතුන් වහන්සේ කොලිය ජනපදයෙහි හලිද්දවසන නම් කෝලියයන්ගේ නියම් ගමෙහි වැඩ වසමින් පුණ්ණ කෝලිය පුත්‍රයාට හා කුක්කුරවතිකට දේශනා කළ සූත්‍රය කුක්කුරවතික සූත්‍රයයි. මෙහි කුක්කුරවතික තෙමේ බුදුරජුන් සමීපයේ පැවිදි වූ අතර පුණ්ණ කෝලිය පුත්‍රයා උපාසකයෙකු බවට පත්විය.[48]

- සුභ මාණවක

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා නොබෝ කාලෙකින් ආනන්ද හිමියන් සැවැත් නුවර වැඩ වාසය කරන සමයේ තෝදෙය්‍ය සිටුවරයාගේ පුත්‍ර සුභ මාණවකට දේශනා කරන ලද සූත්‍රය සුභ සූත්‍රයයි. අනෙකුත් අය බුදුරජුන්ගෙන් උපාසක තත්වය අපේක්‍ෂා කළාක් මෙන් ම සුභ මාණවක තෙමේ ආනන්ද හිමියන්ගෙන් උපාසකයෙකු හැටියට පිළිගන්නා ලෙස ඉල්ලා සිටියි.[49] බුදුන් ධරමාන සමයේ දී ද සුභ මාණකට සුභ සූත්‍රය නමින් සූත්‍රයක් ද,[50] චූළකම්මවිභංග නමින් සූත්‍රයක් ද[51] දේශනා කර ඇත. තම පියාණන් වූ තොදෙය්‍ය බමුණා මියගොස් කෙටි කලකින් දේශනා කළ සූත්‍ර දෙකක් ලෙස මේවා හැඳින්වේ. එහිදී ද මොහු බුදුන්ගෙන් උපාසක තත්ත්වය ඉල්ලා ඇත.

- සංගාරව මාණවක

කොසොල් ජනපදයෙහි වැඩ වෙසෙන සමයේ සංගාරව නම් මාණවකයාට දේශිත සූත්‍රය සංගාරව සූත්‍රයයි. මොහු ද ත්‍රිවේදයෙහි පරතෙරට පත්ව, ඉතිහාසය, නිඝණ්ඩු, කේටුභ, ව්‍යාකරණ අදා ශාස්ත්‍රයන් පිළිබඳ දැනුමක් ලබා සිටි මාණවකයෙකි. කොසොල් රට සිටි ධනඤ්ජානි බැමිණිය බුදුරජුන්ට තෙවරක් නමස්කාර කරමින් උදන් ඇනූ විට එය අසා බුදුන්ගෙන් බණ අසා උපාසකයෙකු විය.[52]

- චුන්දකර්මාර පුත්‍රයා

බුදුරජුන්ට අවසාන දානය පිරිනැමූ චුන්ද කර්මාර පුත්‍රයා ද දසකුසල කර්ම පථයන් පිළිබඳ අනුමෙවෙනි දම් අසා අවසානයේ බුදුරජුන්ගෙන් උපාසක තත්ත්වය ඉල්ලා ඇත.[53]

- සුප්පබුද්ධ නම් තැනැත්තා

රජගහ නුවර විසූ සුප්පබුද්ධ නමින් හැඳින් වූ තැනැත්තා කුෂ්ඨ රෝගයක් තිබූ කෙනෙකි. එබැවින් ඔහු සුප්පබුද්ධ කුට්ඨී යන නමින් ම හඳුන්වා ඇත. යහපත් වූ ධර්මය අසා උපාසකයෙකු විය.[54]

- උපාසක තත්ත්වය ඉල්ලූ පරිබ්‍රාජකයින්
- තිම්බරුක පරිබ්‍රාජකයා

සැවැත් නුවර වැඩ වෙසෙන සමයේ තිම්බරුක පරිබ්‍රාජකයාට දේශනා කළ සූත්‍රය තිම්බරුක සූත්‍රයයි. සයංකත පරංකත ආදි වශයෙන් ඉගැන්වෙන වාද පිළිබඳ බුදුන්ගෙන් විමසා ඇත. මීට බුදුරජුන් පටිච්චසමුප්පාද දේශනාව සිදු කිරීමෙන් උපාසකයෙකු වී ඇත.[55]

- මෝළිය සීවක පරිබ්‍රාජකයා

රජගහ නුවර වේළුවනාරාමයේ වැඩ වෙසෙන සමයේ මෝළිය සීවක නම් පරිබ්‍රාජකයාට සීවක සූත්‍රය දේශනා කර ඇත. මෝළිය යනු ඔටුන්නයි. එසේනම් මෙම පරිබ්‍රාජකයා තවත් පරිබ්‍රාජක පිරිසකට ආචාර්යවරයෙක් වශයෙන් සිටි කෙනෙක් යැයි සිතිය හැකිය. සැප, දුක හා අදුක්ඛම සුඛ ආදිය විඳින්නේ පෙර කරන ලද කර්මයන් නිසා බව ඔහුගේ අදහස විය. එහෙත් ලෙඩ රෝග ආදි දේ ඇති වන්නේ වාතය, සෙම, පිත ආදිය කෝප වීමෙන් බව වටහා දුන් පසු උපාසකයෙකු විය.[56]

- නන්දිය පරිබ්‍රාජකයා

සැවැත් නුවර සිටි නන්දය පරිබ්‍රාජකයා ද මහ පිරිස් සහිතව සිටි කෙනෙකි. නිවන් දැකීමට හේතුවන කාරණා විමසූ අවස්ථාවේ ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිපැදීමෙන් නිවසන් අවබෝධ කරගත හැකි බව පෙන්වා දුන් පසු උපාසකයෙකු විය.[57]

- උපාසක තත්ත්වය ඉල්ලූ ගෘහපතියන්
- පෝතලිය ගෘහපතියා

බුදුරජාණන් වහන්සේ අංග ජනපදයේ අංගුත්තරා නම් නියම් ගමේ වැඩ වසන සමයේ පෝතලිය ගෘහපතියාට දේශනා කළ සූත්‍රය පෝතලිය සූත්‍රයයි. බුදුරජුන් තමන්ට ගහපතිවාදයෙන් දොස් නගන බව සැලකූ ඔහු නොසතුටුව සිටියේය. විස්තරාර්ථ වශයෙන් ධර්මය දේශනා කළවිට තෙරුවන් සරණ ගිය උපාසකයෙක් බවට පත්විය.[58]

- උපාලි ගෘහපතියා

බුදුරජාණන් වහන්සේ නාලන්දා නුවර පාවාරික වනයෙහි වැඩ වසන සමයේ උපාලි ගෘහපතියාට දේශනා කළ සූත්‍රය උපාලි සූත්‍රයයි. උපාලි ගෘහපතියා යනු නිගණ්ඨනාථ පුත්තගේ ප්‍රධාන අනුගාමිකයෙකි. නිගණ්ඨනාථපුත්තගේ පිරිසේ සිටි දීඝ තපස්සී නිගණ්ඨ තෙමේ බුදුරජුන් සමග වාදයට පැමිණ පරාද වී ගිය පසු උපාලි ගෘහපතියා බුදුරජුන් සමීපයට පැමිණ වාද කළේය. වාදය අවසානයේ බුදුරජුන් සත්‍යය වටහා දීමෙන් පසු ඔහු උපාසකයෙකු ලෙස පත්කර ගන්නා ලෙස ඉල්ලීය. මෙසේ

ඉල්ලන විට තෙවරක් ම එය ප්‍රතික්ෂේප විය. ඊට හේතු වූයේ උපාලි ගෘහපතියා නිගණ්ඨනාථයන්ගේ ප්‍රධාන ශ්‍රාවකයෙක් වූ නිසාය. තෙවෙනිවර ඉල්ලීම ප්‍රතික්ෂේප වූ විට තෙමේම නිවසට ගොස් උපාසකයෙකු වී නිගණ්ඨයන්ට ආහාර පාන දීම වළක්වා බුදුසවුවන්ට පමණක පිණ්ඩපාතය ලබා දී ඇත. එවිට දීඝතපස්සී නම් නිගණ්ඨ තෙමේ අවුත් බොහෝ කරුණු කීවත් එයින් ඵලක් නොවීය. අවසානයේ නිගණ්ඨනාථපුත්තයාණ් ම පැමිණ කරුණු කියා ඇති අතර එයින ද ඵලක් වී නැත. ඔහු තෙරුවන් සරණ ගිය උපාසකයෙකු වශයෙන් ම සිටියේය.[59]

- සිගාල ගෘහපතියා

බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයේ වැඩ සිටින අවස්ථාවේ සිගාල ගෘහපතියාට දේශනා කළ සූත්‍රය සිගාලෝවාද සූත්‍රයයි. මොහු තම දෙමාපියන් මියගිය විට තෙමුණු කෙස් හා වස්ත්‍ර ඇතිව සදිසා නමස්කාර කළ කෙනෙකි. අර්ථවත් ලෙස සදිසා නමස්කාර කරන්නේ කෙසේද යන්න බුදුරජුන් පෙන්වා දුන් අවස්ථාවේ තෙරුවන් සරණ ඉල්ලා ගියේය.[60]

- උපාසක තත්ත්වය ඉල්ලූ වෛද්‍යවරුන්

බුදුරජාණන් වහන්සේ රජගහ නුවර ජීවක අඹ වනයෙහි වැඩ වසන සමයේ ජීවක නම් වෛද්‍යවරයාට දේශනා කළ සූත්‍රය ජීවක සූත්‍රයයි. මෙහි ජීවක හඳුන්වා ඇත්තේ 'ජීවක කෝමාරභච්ච' යන නමිනි. ''කෝමාරභච්ච'' යනු ළදරු පෝෂණය පිළිබඳ වෛද්‍ය ශාස්ත්‍රය දන්නා යන්නයි.[61] මොහු ද බුදුන්ගෙන් බණ අසා උපාසක තත්ත්වය ඉල්ලූ අයෙකි.[62]

- උපාසක තත්ත්වය ඉල්ලූ ගම් ප්‍රධානීන්
- චණ්ඩ ගම්පතියා

සැවැත් නුවර වැඩ වස සමයේ චණ්ඩ ගම්පතියාට දේශනා කළ සූත්‍රය චණ්ඩ සූත්‍රයයි. මොහු බුදුන්ගේ ලඟ තෙරුවන් සරණ ගිය උපාසකයෙකි.[63]

- යෝධාජීව ගම්පතියා

සැවැත් නුවර සිටි යෝධාජීව ගම්පතියාට එනමින් දෙසූ සූත්‍රය අසා උපාසකයෙකු විය.[64] හත්ථාරෝහ, අස්සාරෝහ, අසිබන්ධක, පාටලිය, ආදි නම්වලින් සැඳුම්ලත් ගම් ප්‍රධානීන් බුදුන්ගේ ලඟ උපාසකවරු වූහ. මොවුහු සියලු දෙනාම නිගණ්ඨනාථ පුත්තයන්ගේ ශ්‍රාවකයෝය.[65]

- උපාසක තත්ත්වය ඉල්ලූ රියදුරන්
- කෙසී රියදුරා

කෙසී රියදුරා වනාහි අශ්වයන් දමනය කිරීමෙහි දක්ෂව සිටි කෙනෙකි. ඔහු ඇතැම් විට මෘදු හඬින් ද, ඇතැම්විට පරුෂ හඬින් ද අසුන් දමනය කරන බව දන්වයි. බුදුරජුන් ද එසේම පුරුෂයන්

දමනයෙහි දක්ෂයෙකි. උන්වහන්සේ ද මෘදු හා රළු හඬින් දමනය කිරීම සිදු කරයි. මේ අදි ධර්මය අසා ඔහු උපාසකයෙකු විය.

- පිරිස් වශයෙන් සිටි අය උපාසකවරුන් වශයෙන් පිළිගන්නා ලෙස ඉල්ලා සිටි  අවස්ථා
- සාලෙය්‍යක වැසි බ්‍රාහ්මණ ගෘහපතීහු.

බුදුරජාණන් වහන්සේ කොසොල් රට සාලා නම් බ්‍රාහ්මණ ගමෙහි වැඩවසන සමයේ සාලා නම් ගමේ විසූ බමුණන් හා ගෘහපතීන්ට දේශනා කළ සූත්‍රය සාලෙය්‍යක සූත්‍රයයි. මුලින් මෙම පිරිස පැමිණ ඇතමෙක් භාග්‍යවතුන් වහන්සේට වැඳ සිටියහ. ඇතමෙක් බුදුරජුන් සමග සතුටු සාමිචියේ යෙදී සිටියහ. ඇතමෙක් බුදුන් දෙසට නැමී ඇදිලි පමණක් බැඳ වැන්දාහ. ඇතමෙක් තම තමන්ගේ නම්ගොත් කියා හිඳගත්හ. ධර්මය අවසානයේ පැහැදුණු සියලු දෙනා තෙරුවන් සරණ ගොස් උපාසකයින් ලෙස පිළිගන්නා ලෙස ඉල්ලූහ.[66] මොවුන්ට දේශනා කළ තවත් සූත්‍රයක් ලෙස අපණ්ණක සූත්‍රය පෙන්වා දිය හැකිය. එම සූත්‍ර දේශනාවසනායේ දී ද උපාසකයන් ලෙස සලකන මෙන් ඉල්ලා සිටියහ.[67]

- වේරඤ්ජක වැසි බ්‍රාහ්මණ ගෘහපතීහු.

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ සිටින අවස්ථාවේ වේරඤ්ජක වැසි බ්‍රාහ්මණ ගෘහපතීන්ට දෙසූ සූත්‍රය වේරඤ්ජක සූත්‍රයයි. මෙම පිරිස් ද සාලෙය්‍යක වැසි බමුණු ගාහපතීන් සේම පැමිණ හිඳගත්හ. ධර්මය අවසානයේ පැහැදුණු සියලු දෙනා තෙරුවන් සරණ ගොස් උපාසකයින් ලෙස පිළිගන්නා ලෙස ඉල්ලූහ.[68]

- වේළුද්වාර වැසි බ්‍රාහ්මණ ගෘහපතීහු

කොසොල් ජනපදයට අයත් වේළුද්වාර බ්‍රාහ්මණ ගමෙහි සිටි බ්‍රාහ්මණ ගෘහපතීහු වේළුද්වාරෙය්‍ය සූත්‍රය අසා උපාසකවරු වූහ.[69]

- නගරවින්ද වැසි බ්‍රාහ්මණ ගෘහපතීහු

කොසොල් ජනපදයෙහි වැඩ වසන සමයේ එම ජනපදයට අයත් නගරවින්ද වැසි බ්‍රාහ්මණ හා ගෘහපතීන්ට දේශනා කළ සූත්‍රය නගරවින්දෙය්‍ය සූත්‍රයයි. මිනිසුන් අතර ඇති රාග, ද්වේෂ හා මෝහාදීන් දුරු කරගැනීමට ධර්මය දේශනා කළ අතර එය ඇසූ එම ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපතීහු බුදුරජුන් සමීපයේ උපාසකයෝ බවට පත්වූහ.[70]

- වේනාගපුර බ්‍රාහ්මණ ගෘහපතිහු

කොසොල් ජනපදයට අයත් වේනාගපුර නම් බ්‍රාහ්මණ ගමේ බ්‍රාහ්මණ ගෘහපතීහු බුදුන්ගේ කීර්ති ශබ්දය අසා පැමිණ උපාසකවරු වූහ.[71]

- බෝමදුස්සක බ්‍රාහ්මණ ගෘහපතීහු

ශාක්‍ය ජනපදයේ බෝමදුස්ස නම් ශාක්‍යයන්ගේ නියම්ගමේ වැඩවසන සමයේ බෝමදුස්ස සූත්‍රය දේශනා කර ඇත. එම ගම් වැසි බ්‍රාහ්මණ හා ගෘහපති සියල්ලෝම බුදුන්රජුන් ඇතුළු ශ්‍රාවකයින්ට මුඩු මහණෝ යැයි දොස් පැවරූහ. ඊට පිළිතුරු දෙමින් බුදුරජුන් පැවසූයේ රාග, ද්වේශ, මෝහ ආදීන්ගෙන් වෙන්වීම මහණුන්ගේ ස්වභාවය බවයි. ඉන්පසු සියල්ලෝම උපාසකවරු වූහ.[72]

ඉහතින් සඳහන් කරන්නට යෙදුනේ බුදු බණ අසා සම්බුද්ධ ශාසනය තුළ උපාසකත්වය ඉල්ලූ විවිධ තරාතිරම්වලට අයත් පුද්ගලයන් පිළිබඳව ය. මෙම පුද්ගලයන් දෙස බැලීමේ දී පෙනී යන්නේ බොහෝ දෙනෙක් එකළ බ්‍රාහ්මණ ධර්මය අදහමින් සිටි පිරිස් වශයෙනි. ප්‍රසිද්ධ බ්‍රාහ්මණයින් පවා බුදුරජුන්ගෙන් බණ අසා උපාසක තත්ත්වය ඉල්ලා ඇත. ජාණුස්සෝණි, සංගාරව වැනි ඇතැම් බමුණෝ ද, සුභ මාණවක වැනි අය ද එක්වරක් නොව ඔවුන්ට දේශනා කළ සෑම සූත්‍රයක් අවසානයේ ම උපාසකත්වය ඉල්ලා ඇති ආකාරය පැහැදිලි වෙයි. මීට අමතරව නම් සඳහන් නොවන ''අඤ්ඤතරො බ්‍රාහ්මණො'' අඤ්ඤතරො මාණවො'' අඤ්ඤතරො පුරිසො ආදි වශයෙන් ධර්මය ඇසූ පුද්ගලයින් ද උපාසක තත්ත්වය ඉල්ලා ඇති අයුරු අංගුත්තර නිකායේ බොහෝ සූත්‍රවලින් පෙනේ. මේ අනුව බුදුරජාණන් වහන්සේ විසින් යම් කෙනෙකුට ධර්මය දේශනා කළේ නම් ඒ සියල්ලෝම පාහේ බුදුන්ගෙන් උපාසකත්වය ඉල්ලා ඇත. බුදුන් සමග වාද විවාදයට, තර්ක විතර්කයට පමණක් නොව බුදුන්ගේ කීර්ති ශබ්දය අසා පැමිණි සියල්ලෝම එසේ උපාසකයෝ බවට පත් වී ඇත්තාහ. ඇතැම් අයට කෙටි දේශනා සිදු කිරීමෙන් අනතුරුව උපාසක වූ අතර, ඇතැමුන්ට විස්තරාර්ථ දේශනා සිදු කිරීමෙන් පසු උපසාකයෝ බවට පත් වී ඇත. ඒ අනුව සම්බුද්ධ ශාසනය තුළ උපාසකයින් බවට පත් වූ ප්‍රමාණය කෙතෙක් ද යන්න කිව නොහැකිය. මහාවග්ග පාළියේ මහාක්ඛන්ධකයේ රජගහ නුවරදී පමණක් එක් නහුතයක් උපාසකයෝ බවට පත් වූ බව සඳහන් වෙති.[73] මෙහි නම් සඳහන් නොවුණු අනෙක් සියල්ලෝ ම බුදුන් සමීපයේ තෙරුවන් සරණ ගොස් පැවිදි තත්ත්වයට පත් වූවෝ වෙති.

ආන්තික සටහන්

---

[1] මහාවග්ග පාළි, මහාක්ඛන්ධකං, රාජායතන කථා, 8 පිටුව.

[2] ''තෙ ච ලොකෙ පඨමං උපාසකා අහෙසුං ද්වෙවාචිකා''   -එම-, 8 පිටුව.

[3] ''සො ච ලොකෙ පඨමං උපාසකො අහොසි තෙවාචිකො'' -එම- යසස්ස පබ්බජ්ජා කථා, 34 පිටුව.

[4] ''අභික්කන්තං භන්තෙ භො ගොතම, අභික්කන්තං භන්තෙ භො ගොතම, සෙය්‍යථාපි භන්තේ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙල පජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති'ති. එවමෙතං භන්තෙ භගවතා අනෙක පරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තේ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛු සංඝඤ්ච. උපාසකං මං භන්තේ භගවා ධාරෙතු අජ්ජතග්ගේ පාණුපෙතං සරණං ගතං                    ත්‍රිපිටකයේ බොහෝ සූත්‍ර.

[5] මහාවග්ග පාළි, මහාක්ඛන්ධකං, 78 පිටුව.

[6] සංයුක්ත නිකාය, කොසල සංයුක්තය, දහර සූත්තං, 132 පිටුව.

[7] දීඝනිකාය, සීලක්ඛන්ධ වග්ග, සාමඤ්ඤඵල සූත්තං, 146 පිටුව.

[8] සංයුක්ත නිකාය, සළායතන සංයුක්තය, භාරද්වාජ සූත්තං, 332 පිටුව.

[9] අංගුත්තර නිකාය, චතුක්ක නිපාතය, මහාවග්ග, භද්දිය සූත්තං, 376 පිටුව.

[10] අංගුත්තර නිකාය, පඤ්චක නිපාතය, මුණ්ඩරාජ වග්ග, භද්දිය සූත්තං, 98 පිටුව.

[11] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, මධුර සූත්තං, 478 පිටුව.

[12] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, අභයරාජකුමාර සූත්තං, 98 පිටුව.

[13] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, බෝධිරාජකුමාර සූත්තං, 514 පිටුව.

[14] චුල්ලවග්ග පාළි, සෙනාසනක්ඛන්ධකය, 164 පිටුව.

[15] අංගුත්තර නිකාය, අට්ඨක නිපාතය, මහාවග්ග, සීහ සේනාපතී සූත්තං, 67 පිටුව.

[16] දීඝනිකාය, මහාවග්ග, පායාසි රාජඤ්ඤ සූත්තං, 164 පිටුව.

[17] දීඝනිකාය, සීලක්ඛන්ධ වග්ග, අම්බට්ඨ සූත්තං, 220 පිටුව.

[18] දීඝනිකාය, සීලක්ඛන්ධ වග්ග, සොණදණ්ඩ සූත්තං, 244 පිටුව

[19] දීඝනිකාය, සීලක්ඛන්ධ වග්ග, කූටදන්ත සූත්තං, 320 පිටුව

[20] දීඝනිකාය, සීලක්ඛන්ධ වග්ග, ලොහිච්ච සූත්තං, 592 පිටුව.

[21] සංයුක්ත නිකාය, සළායතන සංයුක්තය, ලොහිච්ච සූත්තං, 547 පිටුව.

[22] මජ්ඣිම නිකාය, මූලපණ්ණාසකය, භයභේරව සූත්තං, 54 පිටුව.

[23] සංයුක්ත නිකාය, බ්‍රාහ්මණ සංයුක්තය, කසී සූත්තං, 310 පිටුව.

[24] ඛුද්දක නිකාය, සුත්තනිපාත පාළි, උරග වග්ග, වසල සූත්තං, 47 පිටුව.

[25] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, බ්‍රහ්මායු සූත්තං, 594 පිටුව.

[26] සංයුක්ත නිකාය, බ්‍රාහ්මණ සංයුක්තය, උදය සූත්තං, 310 පිටුව.

[27] මජ්ඣිම නිකාය, මූලපණ්ණාසකය, චූළසාරොපම සූත්තං, 492 පිටුව.

[28] සංයුක්ත නිකාය, බ්‍රාහ්මණ සංයුක්තය, දෙවහිත සූත්තං, 314 පිටුව.

[29] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, ඝොටමුඛ සූත්තං, 642 පිටුව.

[30] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, චංකී සූත්තං, 666 පිටුව.

[31] බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සිංහල අකාරාදිය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 1998, 389 පිටුව.

[32] සංයුක්ත නිකාය, බ්‍රාහ්මණ සංයුක්තය, මානත්ථද්ධ සූත්තං, 318 පිටුව.

[33] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, එසුකාරී සූත්තං, 678 පිටුව.

[34] මජ්ඣිම නිකාය, උපරි පණ්ණාසකය, ගණකමොග්ගල්ලාන සූත්තං, 98 පිටුව.

[35] සංයුක්ත නිකාය, බ්‍රාහ්මණ සංයුක්තය, පච්චනීකසාත සූත්තං, 320 පිටුව.

[36] සංයුක්ත නිකාය, බ්‍රාහ්මණ සංයුක්තය, නවකම්මික සූත්තං, 322 පිටුව.

[37] සංයුක්ත නිකාය, බ්‍රාහ්මණ සංයුක්තය, මාතුපොසක සූත්තං, 324 පිටුව.

[38] සංයුක්ත නිකාය, බ්‍රාහ්මණ සංයුක්තය, භික්ඛක සුත්තං, 326 පිටුව.
[39] සංයුක්ත නිකාය, බ්‍රාහ්මණ සංයුක්තය, සංගාරව සුත්තං, 328 පිටුව.
[40] දීඝනිකාය, සීලක්ඛන්ධ වග්ග, පොට්ඨපාද සුත්තං, 436 පිටුව
[41] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, අග්ගිවච්ඡගොත්ත සුත්තං, 264 පිටුව.
[42] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, දීඝනඛ සුත්තං, 286 පිටුව.
[43] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, වේඛනස සුත්තං, 402 පිටුව.
[44] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, අස්සලායන සුත්තං, 626 පිටුව.
[45] දීඝනිකාය, සීලක්ඛන්ධ වග්ග, තෙවිජ්ජ සුත්තං, 642 පිටුව.
[46] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, වාසෙට්ඨ සුත්තං, 710 පිටුව.
[47] දීඝනිකාය, මහාවග්ග, මහාපරිනිබ්බාන සුත්තං, 206 පිටුව.
[48] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, කුක්කුරවතික සුත්තං, 90 පිටුව.
[49] දීඝනිකාය, සීලක්ඛන්ධ වග්ග, සුභ සුත්තං, 482 පිටුව
[50] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, සුභ සුත්තං, 732 පිටුව.
[51]මජ්ඣිම නිකාය, උපරි පණ්ණාසකය, චූළකම්මවිභංග සුත්තං, 442 පිටුව.
[52] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, සංගාරව සුත්තං, 760 පිටුව.
[53] අංගුත්තර නිකාය, දසක නිපාතය, ජාණුස්සෝණි වග්ග, චුන්ද සුත්තං, 491 පිටුව.
[54] ඛුද්දක නිකාය, උදාන පාළි, සෝණවග්ග, සුප්පබුද්ධකුට්ඨි සුත්තං, 226 පිටුව.
[55] සංයුක්ත නිකාය, අභිසමය සංයුක්තය, තිම්බරුක සුත්තං, 38 පිටුව.
[56] සංයුක්ත නිකාය, වේදනා සංයුක්තය, සීවක සුත්තං, 196 පිටුව.
[57] සංයුක්ත නිකාය, මග්ග සංයුක්තය, නන්දිය සුත්තං, 256 පිටුව.
[58] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, පෝතලිය සුත්තං, 52 පිටුව.
[59] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, උපාලි සුත්තං, 70 පිටුව.
[60] දීඝනිකාය, පාථික වග්ග, සිගාල සුත්තං, 310 පිටුව.
[61] බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සිංහල අකාරාදිය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 1998, 168 පිටුව.
[62] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, ජීවක සුත්තං, 58 පිටුව.
[63] සංයුක්ත නිකාය, ගාමණි සංයුක්තය, චණ්ඩගාමණී සුත්තං, 559 පිටුව.
[64] සංයුක්ත නිකාය, ගාමණි සංයුක්තය, යෝධාජීව සුත්තං, 564 පිටුව.
[65] සංයුක්ත නිකාය, ගාමණි සංයුක්තය, පාටලිය සුත්තං, 632 පිටුව.
[66] මජ්ඣිම නිකාය, මූලපණ්ණාසකය, සාලෙය්‍යක සුත්තං, 872 පිටුව.
[67] මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, අපණ්ණක සුත්තං, 128 පිටුව.
[68] මජ්ඣිම නිකාය, මූලපණ්ණාසකය, වෙරඤ්ජක සුත්තං, 684 පිටුව.
[69] සංයුක්ත නිකාය, සොතාපත්ති සංයුක්තය, වේළුද්වාරෙය්‍ය සුත්තං, 405 පිටුව.
[70] මජ්ඣිම නිකාය, උපරි පණ්ණාසකය, නගරවින්දෙය්‍යක සුත්තං, 606 පිටුව.
[71] අංගුත්තර නිකාය, තික නිපාත, මහාවග්ග, වෙනාගපුර සුත්තං, 330 පිටුව.
[72] සංයුක්ත නිකාය, බ්‍රාහ්මණ සංයුක්තය, බෝමදුස්ස සුත්තං, 330 පිටුව.
[73] මහාවග්ග පාළි, මහාක්ඛන්ධකං, 76 පිටුව.